මාධ්‍ය නිවේදනය

**<u>ශ්‍රී ලංකාව සහ චීනය අතර රෙන්මින්බි (RMB) මිලියන 2000ක මූල්‍ය පහසුකමක්</u>**

ශ්‍රී ලංකා රජය සහ චීන සංවර්ධන බැංකුව අතර රෙන්මින්බි (RMB) මිලියන 2000ක (ඇමරිකානු ඩොලර් මිලියන 309ක) මූල්‍ය පහසුකමක් සඳහා වන ගිවිසුමක් 2021 අගෝස්තු 17 වන දින අත්සන් තබන ලද අතර, මෙයට අදාළ අරමුදල් අද දිනයේ දී ලැබීමට අපේක්ෂිතය. රටේ සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් චීන රජය සහ චීන සංවර්ධන බැංකුව වෙත කරන ලද ඉල්ලීමක් අනුව රටෙහි සංවර්ධන ප්‍රයත්නයන් සඳහා සහයෝගය ලබා දීමේ අරමුණින් මෙම මූල්‍ය පහසුකම ලබා දෙන ලදී. ඉතා සහනදායී කොන්දෙසි යටතේ ලබා දී ඇති මෙම මූල්‍ය පහසුකම සඳහා ණය ආපසු ගෙවීමේ කාලය වසර 10ක් වන අතර, ණය සහන කාලය වසර 03කි.